# විශ්වවිද්‍යාල සිසුන් පරිගණක පාඨමාලා සඳහා යොමු වීමේ ප්‍රවණතාවය (කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජවිද්‍යා පීඨය ඇසුරින්)

ඩී. පී. ඩී. දුලාරි[1]

**සංක්ෂේපය**

ලොවම විශ්ව ගම්මානයක් බවට පත්ව ඇති යුගයක විශ්වවිද්‍යාල සිසුන්ගේ පරිගණක සාක්ෂරතාවය වැඩි දියුණු කිරීම සඳහාත්, ඔවුන් රැකියා වෙළඳපලට සුදුසු වන ලෙස ගොඩනැංවීමටත් විශ්වවිද්‍යාලය තුළ සිසුන් සඳහා පරිගණක පාඨමාලා පවත්වන ලබයි. පරිගණක පාඨමාලා සඳහා සිසුන් යොමු වීමේ ප්‍රවණතාවය පිළිබඳ සොයා බැලීම සඳහා කැලණිය විශ්වවිද්‍යාලය ආශයෙන් පර්යේෂණයක් සිදු කරන ලදි. මෙම අධ්‍යයනය සඳහා මූලික වශයෙන් ප්‍රාථමික දත්ත යොදාගත් අතර, ඒ සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා පීඨයේ වර්ෂ 4 න් සිසුන් 25 දෙනා බැගින් මුලු සිසුන් ගණන 100 කින් යුත් සසම්භාවී නියැදියක් යොදා ගන්නා ලදී. අධ්‍යයනය සඳහා ප්‍රශ්නාවලියක් මාර්ගයෙන් හා ව්‍යුහගත නොවන සම්මුඛ සාකච්ඡා ක්‍රමය භාවිතයෙන් ප්‍රාථමික දත්ත රැස් කර ගෙන ඇත. මීට අමතරව ද්විතියික මූලාශ්‍ර වන සඟරා, පුවත්පත්, අන්තර්ජාලය ඇසුරෙන් ද්විතියික දත්ත ලබාගන්නා ලදී. දත්ත විශ්ලේෂණය සඳහා විස්තරාත්මක සංඛ්‍යාන විශ්ලේෂණ ක්‍රම භාවිත කරන ලදී. පළමු වසරෙන් 88% ක්, දෙවන වසරෙන් 64% ක්, තෙවන වසරෙන් 28% ක් සිව්වන වසරෙන් 12% ක් වශයෙන් පරිගණක පාඨමාලාවන් සඳහා යොමු වන බවත්, සියලු වසර වලින් 52% සිසුන් ප්‍රමාණයක් පාඨමාලා සඳහා යොමු නොවන බවත් අනාවරණය විය. තවද පළමු වසරේ දී පාඨමාලා සඳහා යොමු වීම ඉහළ අගයක් ගත්තද, ඉහළ වසරයන්හි දී එම අගය ක්‍රමයෙන් අඩු වී ඇත. මේ සඳහා ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ සිසුන්ට පරිගණක පාඨමාලා සඳහා කාලය වෙන් කර ගත නොහැකි වීම, විශ්වවිද්‍යාල අධ්‍යාපනයට පෙර පරිගණක පාඨමාලා හදාරා තිබීම හා පරිගණක පාඨමාලා හැදෑරීමට උනන්දුවක් නොතිබීම ආදියයි. ඒ අනුව මෙම අධ්‍යයනයෙන් කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා පීඨයේ සිසුන්ගේ පරිගණක පාඨමාලාවන් සඳහා යොමු වීම අඩු මට්ටමක පවතින බව නිගමනය කළ හැකි විය. සිසුන් සඳහා පරිගණක පාඨමාලා අනිවාර්ය කිරීම හා යොමු වීමෙන් ලැබෙන ප්‍රතිලාභ පිළිබඳ දැනුවත් කිරීමෙන්, වැඩි වශයෙන් සිසුන් පරිගණක පාඨමාලාවන් හැදෑරීමට යොමු කර ගැනීමට හැකි වේ යැයි අපේක්ෂා කළ හැකිය.

**මුඛ්‍ය පද :** විශ්වවිද්‍යාල සිසුන්, පරිගණක පාඨමාලා, රැකියා වෙළඳපළ

[1] ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, dulari130203@gmail.com